සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## භූගෝල විද්‍යාව - I

නම/විභාග අංකය :-- ............................................................................. කාලය : පැය 01යි.

- **එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න සියල්ලට ම මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවලට එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

1. පෘථිවි ......................................... සහ ප්‍රාවරණයේ ඉහළ කොටස ඇතුළත් කලාපය ශිලාගෝලය වේ. (හරය, කබොල, ප්‍රාවරණය)

2. උන්නතාංශය සමග උෂ්ණත්වය ක්‍රමයෙන් පහළ බැසීම ..................................... ලෙස හඳුන්වයි. (වායු පීඩනය, පතන සීඝ්‍රතාව, ආර්ද්‍රතාව)

3. පෘථිවි වායුගෝලයේ උෂ්ණත්වය ඉහළ යාමට බලපාන හරිතාගාර වායු අතර ප්‍රධාන වන්නේ .......................... වායුවයි. (කාබන් ඩයොක්සයිඩ්, නයිට්‍රජන්, ඔක්සිජන්)

4. චීනය පිහිටා ඇත්තේ .............................. භූ තැටියේ ය. (යුරේෂියානු, ඉන්දු ඕස්ට්‍රේලියානු, ඇමරිකානු)

5. ගොඩබිමක පිහිටි ජලය පිරුණු ආවාට ............................ නමින් හැඳින්වේ. (විල්, දූපත්, ගංගා)

6. රබර් වගාව සඳහා ............................ පස යෝග්‍ය වේ. (ලෝම ලැටරයිට් පස, කබොක් මිශ්‍ර රතු පස, චර්නෝෂම් පස)

7. මිරිස් අපනයන ගම්මානය පිහිටා ඇත්තේ ............................................ ය. (රාජාංගණයේ, දඹදෙණිය, කටුගම්පොල)

8. පොළවේ තැන්පත්ව ඇති ඩොලමයිට් ................................................ පාෂාණයකි. (ආග්නේය, අවසාදිත, විපරීත)

9. කන්නෙලිය, දෙදියගල වැනි ප්‍රදේශවල ව්‍යාප්තව ඇත්තේ ............................................ වනාන්තරය (කඳුකර අතරමැදි, සදාහරිත, නිවර්තන වර්ෂා)

10. කිසියම් බිම් ඒකකයක් තුළ ජීවත්වන ජනසංඛ්‍යාව .......................... ලෙස හඳුන්වයි. (ජනගහණය ජනඝනත්වය, නාගරීකරණය)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශ කියවා බලා එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

11. පෘථිවි වායුගෝලීය සංයුතිය අනුව වැඩිපුරම ඇත්තේ නයිට්‍රජන් වායුවයි. (නි / වැ)

12. තිරිඟු වගාවේ වගා බිම් විශාල වීම, එකම භෝගයක් වගා කිරීම, යාන්ත්‍රිකරණය වීම විශේෂ ලක්ෂණයන් වේ. (නි / වැ)

13. ශ්‍රී ලංකාවේ බහුලව ම වී වගාකරන දිස්ත්‍රික්කයක් වන්නේ, නුවරඑළියයි. (නි / වැ)

14. කෝබේ, ඔසාකා යන යකඩ හා වානේ මධ්‍යස්ථාන පිහිටා ඇත්තේ චීනයේ ය. (නි / වැ)

15. 1:50,000 භූ ලක්ෂණ සිතියමක සිතියමේ නම ඇතුලත් වන්නේ ඉහළ වට තීරුවේ ය. (නි / වැ)

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකකි. ඒවා සම්බන්ධතාව අනුව ගැලපූ විට නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.**

16. ලෝකයේ පිහිටා ඇති කඳු කිහිපයක් 'අ' තීරුවේද ඒවා පිහිටා ඇති රටවල් 'ආ' තීරුවේ ද දැක්වේ. ඒවා නිවැරදිව ගළපා පිළිතුර තෝරන්න.

| **අ** | **ආ** |
|---|---|
| අන්දිස් කඳු | A උතුරු ඇමරිකාව |
| ඩ්‍රැකන්බර්ග් කඳු | B දකුණු ඇමරිකාව |
| රොකි කඳු | C ආසියාව |
| | D අප්‍රිකාව |

(1) A B D (2) BDA (3) CBA (4) DCA (.............)

17. 'අ' තීරුවේ සඳහන් දෑ විස්තර කර'ආ' තීරුවේ දක්වා ඇත. ඒවා නිවැරදිව ගළපා පිළිතුර තෝරන්න.

| **'අ'** | **'ආ'** |
|---|---|
| ජලගෝලය | A පෘථිවිය වටා විවිධ වායුවලින් සමන්විත ස්ථරය |
| වායුගෝලය | B ශාක හා සත්ත්ව විශේෂ ඇති ජීව පරිසරය |
| ජෛව ගෝලය | C ගොඩබිම හා සාගරවල ව්‍යාප්තව ඇත. |
| | D ශාක හා සතුන් ද ජලය ද ව්‍යාප්තව ඇති කොටස |

(1) A DB (2) BCD (3) CAB (4) DBC (.............)

18. ශ්‍රී ලංකාවේ පිහිටි ඛනිජ සම්පත් 'අ' තීරුවේ ද එවා පිහිටි ස්ථාන 'ආ' තීරුවේ ඇත. ඒවා ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| **'අ'** | **'ආ'** |
|---|---|
| මිනිරන් | A බෝතලේ |
| මැණික් | B මීරිගම |
| සර්කොන් | C නිලාවේලි |
| | D ඇලහැර |

(1) A DB (2) BAC (3) CBA (4) DAB (.............)

19. 'අ' තීරුවේ ප්‍රධාන ඛනිජ වර්ග ද ඒවාට උදාහරණ 'ආ' තීරුවේ ද ඇත. ඒවා ගලපා පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| ඉන්ධනමය ඛනිජ | A මිනිරන් |
| ලෝහමය ඛනිජ | B ගල් අඟුරු |
| ලෝහ නොවන ඛනිජ | C තඹ |
| | D ඛනිජ තෙල් |

(1) ADC (2) BCA (3) BCD (4) DCA (.............)

20. ලෝකයේ විවිධ රටවල පිහිටා ඇති යකඩ හා වානේ මධ්‍යස්ථාන 'අ' තීරුවේ ද ඒවා පිහිටි රටවල් 'ආ' තීරුවේ ද ඇත. ඒවා නිවැරදිව ගලපන්න.

| අ | ආ |
|---|---|
| දකුණු මැංචූරියා ප්‍රදේශය | A රුසියාව |
| කුෂ්ට්නෙස්ට් කලාපය | B ඇමරිකා එක්සත් ජනපදය |
| පිට්ස් බර්ග් කලාපය | C චීනය |
| | D ජපානය |

(1) ADC (2) BAC (3) CAB (4) DBC (.............)

- **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

21. දකුණු අක්ෂාංශ 23 $1/2^0$ ........................................ නිවර්තනය ලෙස හඳුන්වයි.

22. පෙට්‍රෝලියම්, ගෑස්, ඩීසල් ලබාගැනීමෙන් අනතුරුව ඉතිරිවන ද්‍රව්‍ය ඇසුරින් කෙරෙන නිෂ්පාදන ........................... කර්මාන්තය ලෙස හැඳින්වේ.

23. ස්වාභාවික සම්පත් අතර පස, ජලය, වාතය ආදිය .................................. ලැබෙන සම්පත් ගනයට අයත් වේ.

24. ශ්‍රී ලංකාවේ භූමි පරිභෝජනයෙන් වැඩි කොටසක් ........................................ භෝගවලට යොදවා ඇත.

25. උතුරු අර්ධගෝලයේ අක්ෂාංශ $50^0$ සිට $60^0$ අතර කලාපයේ ...................................... වනාන්තර ව්‍යාප්තව ඇත.

- **අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් රූප සටහන භාවිත කරන්න.**




26. රූප සටහනේ අංක 1 න් දක්වා ඇත්තේ ................................... ලක්ෂණයයි.

27. අංක 2 න් දැක්වෙන්නේ .......................................... යයි.

28. ගංමෝය දක්වා ඇති අක්ෂරය වන්නේ ......................... ය

29. අංක 4 න් දක්වා ඇති වෙරළබඩ භූ ලක්ෂණය වන්නේ ........................................... යි

30. වගුරු බිම් දක්වා ඇත්තේ අංක ....................................... නි

- **ප්‍රශ්න අංක 31 සිට 36 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.**

31. ලෝකයේ කිරිපට්ටි පාලනය සඳහා වඩාත් යෝග්‍ය දේශගුණය වන්නේ.
    1. ශීත දේශගුණ ය   2. උණුසුම් දේශගුණ ය.   3. තුන්ද්‍රා දේශගුණ ය   4. සෞම්‍ය දේශගුණ ය
    (...............)

32. රටක ජන ඝනත්වය කෙරෙහි බලපෑමක් ඇති **නොකරන** සාධකය කුමක් ද?
    1. යටිතල පහසුකම්   2. වයස් ව්‍යුහය   3. සේවා පහසුකම්   4. රාජ්‍ය ප්‍රතිපත්ති
    (...............)

33. ශ්‍රී ලංකාවේ අවසාධිත පාෂාණයක් වන මයෝසීන හුණුගල් ව්‍යාප්තව ඇත්තේ,
    1. යාපන අර්ධද්වීපය හා වයඹ දිග මුහුදු තීරය   2. නිරිත දිග වෙරළ කලාපය
    3. මහනුවර, මාතලේ, නාලන්දා ආදී ප්‍රදේශවල   4. මන්නාරම, අනුරාධපුරය, මඩකලපුව වැනි ප්‍රදේශ
    (...............)

34. එකලස් කිරීමේ කර්මාන්තයේ මූලික පදනම වන්නේ.
   1. විශේෂී කරණය, ශ්‍රමවිභජනය, බහුජාතික සමාගම්
   2. තාක්ෂණ දියුණුව, විශේෂ ප්‍රාගුණ්‍ය, ජාත්‍යන්තර සබඳතා
   3. බහුජාතික සමාගම්, විදේශීය සබඳතා, ශ්‍රම විභජනය
   4. ශ්‍රම විභජනය, විශේෂ ප්‍රාගුණ්‍යය, තාක්ෂණයේ දියුණුව (...............)

35. කෘෂිකාර්මික කටයුතුවලදී පරිසරයට දිගුකාලීන අහිතකර ප්‍රතිඵල ගෙන දෙන්නේ,
   1. කෘෂි රසායනික ද්‍රව්‍ය බහුලව යොදා ගැනීම.
   2. ශෂ්‍යමාරු ක්‍රම භාවිත කිරීම
   3. යන්ත්‍රෝපකරණ යොදා ගැනීම.
   4. වැඩි දියුණු කළ බීජ යොදා ගැනීම
   (...............)

36. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ විශේෂ ලක්ෂණයක් වන්නේ ජන සංඛ්‍යාව වියපත් වීමයි. එයට හේතුව වන්නේ,
   1. උපත් අනුපාතය අඩුවීම හා ආයු අපේක්ෂාව ඉහළ යාම
   2. උපත් අනුපාතය ඉහළ යාම හා ආයු අපේක්ෂාව ඉහළ යාමයි.
   3. මරණ අනුපාතය අඩු වීම හා උපත් අනුපාතය ඉහළ යාම
   4. ආයු අපේක්ෂාව ඉහළයාම හා සංක්‍රමණය වැඩි වීම. (...............)

37. ● මීටර් 1200m ට වැඩි බිම්වල ව්‍යාප්ත වීම,
   ● භූමියේ උස අනුව ගස්වල උස අඩුවීම
   ● ගස් මුදුන් වියනක් සේ සැදී තිබීම
   ● සපු, නික, මිහිරිය වැනි ශාක බහුල වීම
   ඉහත සඳහන් ලක්ෂණ පවතින වෘක්ෂලතා කලාපය කුමක් ද?
   1. නිවර්තන වර්ෂා වනාන්තර
   2. අතර මැදි සදාහරිත වනාන්තර
   3. කඳුකර තෙත් කලාපීය වනාන්තර
   4. කඳුකර වියලි කලාපීය වනාන්තර
   (...............)

- **ප්‍රශ්න අංක 38 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් තොරතුරු උපයෝගී කරගන්න.**

| | | | |
|---|---|---|---|
| A | මුළු ජන සංඛ්‍යාව<br>ඒක පුද්ගල බිම් ප්‍රමාණය | B | කෘමිනාශක භාවිතය<br>පරිසර දූෂණය |
| C | සෞඛ්‍ය සේවා ව්‍යාප්තිය<br>මාතෘ මරණ අනුපාතය | D | භාණ්ඩ අපනයනය<br>විදේශ ඉපයීම් |

38. මෙම අදහස් යුගල අතරින් පළමු වැන්නේ වැඩිවීම දෙවැන්නේ අඩු වීමක් දක්වතත් රටක සංවර්ධනයට හිතකර වන්නේ කිනම් ප්‍රකාශය ද?
   1. A 2. B 3. C 4. D

39. පළමු වැන්නේ වැඩිවීම දෙවැන්නේ වැඩි වීමට හේතු වන බව කියවෙන ප්‍රකාශ ඇතුළත් වන්නේ කිනම් පිළිතුරේ ද?
   1. AB 2. BD 3. BC 4. CD

40. පළමු වැන්නේ වැඩිවීම දෙවැන්නේ අඩුවීමට හේතුවන ප්‍රකාශය තෝරන්න.
   1. AC 2. BD 3. BC 4. CD

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## භූගෝල විද්‍යාව - II

**නම/විභාග අංකය :-- .................................................................................... කාලය : පැය 02 යි.**

- **මෙම ප්‍රශ්න පත්‍රය i, ii වශයෙන් කොටස් දෙකකි.**
- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **II කොටසින් තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.**
- **ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5 කි.**

## I කොටස

1. (අ) ඔබ වෙත සපයා ඇති 1: 50,000 හු ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා සපයා ඇති පිළිතුරු කඩදාසිය භාවිත කරන්න.

(i.) A - B රේඛාවෙන් දක්වා ඇත්තේ (හුදකලා කන්දකි, කොත් කන්දකි, කඳු වැටියකි.) (ලකුණු 01)

(ii) C - D රේඛාවෙන් දක්වා ඇත්තේ (කපොල්ලකි, නිම්නයකි, නෙරුවකි) (ලකුණු 01)

(iii) අංක 1 න් දක්වා ඇති මායිම වන්නේ (පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම්) මායිමකි. (ලකුණු 01)

(iv) අංක 2 ක් දක්වා ඇත්තේ (පාෂාණ උද්ගතයකි, ශේෂ කන්දකි, රක්ෂිත මායිමකි) (ලකුණු 01)

(v) අංක 3 න් දක්වා ඇත්තේ (වේල්ල, වැව් බැම්ම, ගුරුපාර) (ලකුණු 01)

(vi) අංක 4 දක්වා ඇති ස්ථානයේ පිහිටි දේශාංශය නම් කරන්න. (ලකුණු 01)

(vii) E අක්ෂරයෙන් කොටුකර ඇති ප්‍රදේශයේ ඇති භූමි පරිභෝගය නම් කරන්න. (ලකුණු 01)

(viii) මෙම සිතියමට අයත් වන පළාතක් නම් කරන්න. (ලකුණු 01)

(ix) මෙම සිතියම් ප්‍රදේශයේ ජනාවාස බහුල නොවීමට බලපාන හේතුවක් සඳහන් කරන්න. (ලකුණු 01)

(x) G - H දක්වා පාරේ දිග කිලෝමීටර්වලින් සොයන්න. (ලකුණු 01)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුව යොදා ගන්න.

(i) A - B හා C යන අක්ෂරවලින් දැක්වෙන කඳුවැටි අතරින් ඇපලේචියන් කඳු දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) D,E,F අක්ෂර වලින් දක්වා ඇති දූපත් අතරින් කියුබාව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) G,H,J යන අක්ෂර තුනෙන් මෙක්සිකෝ සානුව දක්වා ඇත්තේ කුමන අක්ෂරයෙන් ද?

(iv) K,L,M අක්ෂර අතුරෙන් කපුවගා කරන පංජාබ් ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) N.P.R අක්ෂර අතුරෙන් බෝල්ටික් මුහුද දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 1 x 5 = 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලංකා සිතියමට යාබදව දක්වා ඇති තීරුව යොදා ගන්න.

(i) A - B හා C අක්ෂර අතුරෙන් වවුනියාව දිස්ත්‍රික්කය දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

(ii) D,E,F අක්ෂර අතුරෙන් මැණික් ලැබෙන ඔක්කම්පිටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) G,H,J යන අක්ෂර වලින් දැක්වෙන ගංගා අතුරින් කළු ගංගාව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) K,L,M අක්ෂර අතුරෙන් පර්ල් මුතු පරය පිහිටි ස්ථානය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) N.P.R අක්ෂර වලින් දක්වා ඇති ස්ථාන අතුරෙන් පොල් පර්යේෂණායතනය පිහිටි ලුනුවිල දැක්වෙන්නේ කිනම් අක්ෂරයෙන් ද? (ලකුණු 1 x 5 = 05)

## II කොටස

2. (i) පෘථිවි පද්ධතියේ උප පද්ධති දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   (ii) (a) පෘථිවි ව්‍යුහයට අයත් කොටස් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)
   (b) ප්‍රාවරණයය හා හරය වෙන්වන සීමාව හඳුන්වන්නේ කෙසේ ද? (ලකුණු 01)
   (iii) (a) වායුගෝලීය ස්තර අතුරෙන් පරිවර්ති ගෝලය මිනිසාට වඩා වැදගත් වීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)
   (b) වායුගෝලය දූෂණය වීම හේතු කොටගෙන මිනිසාට ඇතිවන බලපෑම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 03)

3. (i) (a) අප්‍රිකාවේ පිහිටා ඇති ප්‍රධාන ගංගාවක් ද
   (b) ආසියාවේ පිහිටි ප්‍රධාන ගංගාවක් ද පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)
   (ii) (a) මුදුන් කිහිපයක් සහිත විවිධ බෑවුම්වලින් සහ ඉහළ උන්නතාංශයකින් යුක්ත එක දිගට විහිදෙන භූ රූප හඳුන්වන්නේ කෙසේද?
   (b) සම මුදුන් සහිත කඳුවලින් වට වූ උස් සම බිමක් හඳුන්වන්නේ කුමන නමකින් ද?
   (c) ගොඩබිමෙන් සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් වට වූ හෝ සාගරවලට සම්බන්ධ කරදිය ප්‍රදේශ හඳුන්වන්නේ කෙදේ ද? (ලකුණු 03)
   (iii) ගංගා හා විල් මිනිස් ක්‍රියාකාරකම්වලදී වැදගත්වන ආකාරය නිදසුන් දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

4. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සිතියම උපයෝගී කරගන්න.




   (i) ඉහත ලෝක සිතියමේ A B C වශයෙන් දක්වා ඇත්තේ තිරිඟු වගා කරන රටවල් කිහිපයකි. ඉන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   (ii) ලෝකයේ තිරිඟු වගාව ව්‍යාප්ත වීම සඳහා බලපාන භෞතික සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
   (iii) (a) ලෝකයේ කිරිපට්ටි පාලනය කරන රටවල් දෙකක් D, E වලින් දක්වා ඇත. ඒවා නම් කරන්න. (ලකුණු 02)
   (b) කිරිපට්ටි පාලනයේ විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

5. ශ්‍රී ලංකාවේ වී වගා කරන පාරිසරික කලාප යාබද සිතියමේ දක්වා ඇත.




(i) A B වලින් දක්වා ඇති වී වගා පාරිසරික කලාප දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ වී වගා කෙරේ වැඩි අවධානයක් යොමු කිරීමට බලපා ඇති හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ පොල් වගාබිම් ආශ්‍රිත පැන නැගී ඇති ගැටළු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) ශ්‍රී ලංකාවේ තේ අලෙවිය වැඩි කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 03)

6. (i) මුල් කාලයේ යුරෝපා රටවල නැව් තැනීමේ කර්මාන්තය දියුණු කිරීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) වර්තමානයේ දකුණු කොරියාව, ජපානය වැනි රටවල් නැව් නිෂ්පාදනයේ ප්‍රමුඛයන් වීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) විද්‍යුත් කර්මාන්තය යටතේ නිෂ්පාදනය කරන භාණ්ඩ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(b) විද්‍යුත් කර්මාන්තයේ ප්‍රවනතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

7. (i) ස්වාභාවික සම්පත් අතර ජීව හා අජීව සම්පත් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) උපත අනුව පාෂාණ වර්ග තුනකි. ඒවා නම් කරන්න. (ලකුණු 03)

(iii) (a) විවිධ පාෂාණවලින් මිනිසාට ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) පාංශු සංරකේෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 03)




8. (i) යාබද සිතියමේ අංක 1, 2 මගින් පෙන්වා ඇති වනාන්තර වර්ග දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) වෙරළබඩ ගංමෝය කලපු ආශ්‍රිත අනුවර්තනය වූ වෘක්ෂලතා වර්ගය නම් කරන්න. (ලකුණු 01)

(b) එම වෘක්ෂලතා වර්ගයේ ලක්ෂණ 2ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) (a) ශ්‍රී ලංකාවේ වනාන්තර විනාශ වීමට බලපාන හේතු 2ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) වනාන්තර සංරක්ෂණය කිරීම සඳහා ගෙන ඇති පියවර දෙකක් නිදසුන් මගින් විස්තර කරන්න. (ලකුණු 03)

9. (i) ලෝක ජන සංඛ්‍යා ව්‍යාප්තිය කෙරේ බලපාන භෞතික සාධක දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 02)

(ii) ලෝකයේ ජනාධික කලාප තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ලෝක ජන සංඛ්‍යා වර්ධනයේ කැපී පෙනෙන ප්‍රධාන අවධි දෙක නම් කරන්න.
(ලකුණු 02)

(b) ශ්‍රී ලංකා ජන සංඛ්‍යා ව්‍යූහයේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 03)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - II GEOGRAPHY - II

නම/විභාග අංකය :-- ..........................................................................................................................................................




SCALE : 1 : 50 000

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## භූගෝල විද්‍යාව II

නම/විභාග අංකය :-- ..........................................................................................................................

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. (For Examiner's Use Only)

(1) (අ) அ (a)

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

(iii) ..........................................................................................................................

(iv) ..........................................................................................................................

(v) ..........................................................................................................................

(vi) ..........................................................................................................................

(vii) ..........................................................................................................................

(viii) ..........................................................................................................................

(ix) ..........................................................................................................................

(x) ..........................................................................................................................

/ 10

(ආ) / (ஆ) / (b)




5

(ඉ) / (இ) / (c)




5

(1) (අ) /10 (ආ) /5 (ඉ) /5 = /20

Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## භූගෝල විද්‍යාව - පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. කබොල | 11. නි | 21 මකර | 31. 4 (සෞම්‍ය දේශගුණය) |
| 2. පතන ශීඝ්‍රතාව | 12. නි | 22 පෙට්‍රෝරසායන | 32. 2 (වයස් ව්‍යුහය) |
| 3. කාබන්ඩයොක්සයිඩ් | 13. වැ | 23. නිරායාසයෙන් | 33. 1 |
| 4. යුරේෂියානු | 14. වැ | 24. කෘෂි | 34. 4 |
| 5. විල් | 15. නි | 25. කේතුධර | 35. 1 |
| 6. කබොක් මිශ්‍ර රතුපස | 16. (2) BDA | 26. හැඩපළු | 36. 1 |
| 7. රාජාංගනය | 17. (3) CAB | 27. ගංදරය | 37. 3 |
| 8. විපරිත | 18. (1) ADB | 28. 03 | 38. 3 (C) |
| 9. නිවර්තන වර්ෂා | 19. (2) BCA | 29. කලපුව | 39. 2 (BD) |
| 10. ජන ඝනත්වය | 20. (3) CAB | 30. 05 | 40. 1 (AC) |

## II පත්‍රය

1. (අ) i. කොත් කන්ද ii නෙරුව
iii දිස්ත්‍රික් මායිම iv පාෂාණ උද්ගතය
v වේල්ල vi නැ:දේ $80^0.55$
vii වෙනත් වැව්ලි viii උව පලාත / මධ්‍යම පලාත
ix කදුකර ප්‍රදේශයක් වීම, නිසරු වීම, ජලාශ පිහිටීම
x. කි.මී. 07

(ආ) 1. C 2. D 3. H 4. M 5. P

(ඉ) 1. B 2. D 3. G 4. L 5. N

2. i. වායු ගෝලය, ජලගෝලය, ශිලා ගෝලය, ජෛව ගෝලය
ii. (a) පෘථිවි කබොල, ඉහළ ප්‍රාවරණය
(b) ගුටෙන්බර්ග් අසන්නතිය
iii. (a) • වායුගෝලයේ වායුවලින් වැඩි ප්‍රමාණයක් තිබීම.
• ජෛවගෝල ක්‍රියාකාරිත්වයට වැදගත් වීම
• සියලු කාලගුණික සංසිද්ධි ඇතිවන ස්ථරය වීම
• උන්නතාංශය අනුව උෂ්ණත්වය අඩුවීම
• ප්‍රභාසංස්ලේෂණය සිදුවීම
(b) • ස්වසන රෝග ඇති වීම
• ජෛව විවිධත්වයට බලපෑම් කිරීම.
• ඇස් රෝග ඇති වීම
• උෂ්ණත්වය ඉහළ යාම
• ජීවීන්ගේ වාසභූමි අහිමි වීම.

3. i. A. නයිල්, නයිජර්, කොංගෝ සැම්බෙසි ආදි ගංගා....
B. ඔබී, යෙනිසි, ලීනා, අමූර් යැංෂි, ඉන්දු, ගංගා....... ආදිය
ii. (a) කදුවැටි
(b) සානු
(c) මුහුදු
iii. ප්‍රවාහන කටයුතු සඳහා
ධීවර කර්මාන්තය
• දේශසීමා, සීමා ලකුණු කිරීමට
• වැලි ගොඩ දැමීම
• කෘෂි කර්මාන්තය
• සෞන්දර්යාත්මක වටපිටාව

4. i. A පකිස්ථානය
B ආජන්ටිනාව
C ඔස්ට්‍රේලියාව
ii. (a) 300mm 500mm අතර වර්ෂාපතනය
(b) පැල වැඩෙන කාලයේ සිසිල් තෙත් දේශගුණය හොඳින් ජලය බැසයන තැනිතලා බිම්, චර්නෝසම් බිම්
iii. (a) D නවසීලන්තය
E ඩෙන්මාර්කය
(b) • සංවර්ධිත රටවල් කිරිපට්ටි පාලනයේ සියලු අංශයන්හි ප්‍රමුඛත්වය ලබා සිටීම.
• කිරි ආශ්‍රිත වෙළඳපොල සංවර්ධිත රටවල් විසින් පාලනය කිරීම
• දියර කිරි හා කිරි ආශ්‍රිත වෙළඳ පොළ පුළුල් වීම.
• චීස්, බටර්, යෝගට් වැනි කිරි ආශ්‍රිත නිෂ්පාදන වල පරිභෝජනය වැඩි වීම

5. i. A තෙත් කලාපය
B වියලි කලාපය
ii. • ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය බත් වීම.
• දේශීය වෙළඳ බෝගයක් ලෙස වැදගත් වීම.

- කර්මාන්ත කිහිපයකට අමුද්‍රව්‍ය (සහල්, රසකැවිලි, හෝටල්)
- විවිධ රැකියා බිහිවීම....... යනාදිය

iii. (a) • ඉඩම් හිඟය හා ඉඩම් කැබලි වීම.
- පොල් බිම් වෙනත් අවශ්‍යතා සඳහා යෙදවීම
- ජන සංඛ්‍යාව වැඩිවීමත් සමඟ නිවාස හා සංවර්ධන කටයුතුවලට ඉඩම් යෙදවීම
- එකම බිමක දීර්ඝ කාලීනව වගා කිරීම නිසා අස්වැන්න අඩු වීම.
- කෘමි රෝග ඇති වීම.

(b) • තේ විවිධාගනීකරණය
- ආකර්ෂණීය ලෙස තේ නිෂ්පාදන සැකසීම
- ප්‍රචාරණය හා දැනුවත් කිරීම
- නවීන ඇසුරුම් ක්‍රම භාවිතය
- විශාල තේ පෙට්ටි වෙනුවට කුඩා කුඩා ඇසුරුම් ලෙස තේ සකස් කිරීම.

6. i.. • පුනරුදයෙන් පසු ඇති වූ දේශ ගවේශන
- නැව් නිෂ්පාදනය අවශ්‍ය ද්‍රව හා වානේ සපයාගත හැකිවීම
- නැව් තටාක සෑදීමට කඩතොලු සහිත වෙරළ ප්‍රදේශ තිබීම.
- රාජ්‍ය අනුග්‍රහය

ii. • නැව් නිෂ්පාදනයට අවශ්‍ය ලාබදායී ශ්‍රමය ලැබීම
- පුහුණු ශ්‍රමය තිබීම
- නව තාක්ෂණය
- තටාක පහසුකම් සඳහා ජලය නොසිඳෙන ගැඹුරු මුහුදු ප්‍රදේශ තිබීම,

3. (a) ගුවන්විදුලිය, රූපවාහිනිය, පරිඝනකය, ට්‍රාන්සිස්ටර් සන්නිවේදන උපකරණ විද්‍යුත් උපකරණ

(b) • දිනෙන් දින විවිධ නිෂ්පාදන එළිදැක්වීම
- නිෂ්පාදන සඳහා වැය කරන මුදල මෙන් දෙගුණයක් පර්යේෂණ සඳහා වැය කිරීම.
- ශ්‍රමිකයන්ගෙන් විශාල පිරිසක් විද්‍යාඥයින් ඉංජිනේරුවන් පර්යේෂකයන් වීම.
- අතුරු නිෂ්පාදන වෙළඳ පලක් නිර්මාණය වී තිබීම.

7. i. ජීව වනාන්තර, සත්ත්ව සම්පත්, ජලජ සම්පත්
අජීව ජලය, පස, ඛනිජ සම්පත්, සුළං

ii. ආග්නේය, අවසාදිත, විපරිත පාෂාණ

iii. (a) • ගොඩනැගිලි ඉදිකිරීම.
- විසිතුරු භාණ්ඩ නිර්මාණය
- බැවුම් ආරක්ෂාවට යොදා ගැනීම
- බලශක්ති වශයෙන් යොදා ගතහැකි වීම
- පොහොර නිෂ්පාදනය

(b) • පසට සුදුසු භෝග තෝරා ගැනීම
- පස ආවරණ බෝග වැවීම
- තීරුවගා ක්‍රමය
- කුට්ටි කානු දැමීම හා ගල්වැටි බැඳීම
- සමෝච්ච රේඛා ආකාරයට පස පෙරලීම
- පොහොර භාවිතය විධිමත් කිරීමට හා ජෛන්ද්‍රිය පොහොර භාවිතය

**Answer**

8. i. 1. පහතරට තෙත් කලාපීය වනාන්තර
2. වියලි මිශ්‍ර සදාහරිත වනාන්තර

ii. (a) කඩොලාන
(b) • මුල් බහුල වීම
- මුල් ජලයෙන් ඉහළට විහිදීම
- කඩොල්, කිරල දිය කඳුරු ශාක බහුලවීම
- ලවනතාවයට අනුවර්තනය වූ දිගු මුල් සහිත මිටි ගස් වර්ග දක්නට ලැබීම.

iii. (a) • ජන සංඛ්‍යාව වැඩිවීම හා මිනිසාගේ අවශ්‍යතා වැඩිවීම
- කාර්මීකරණය වැඩිවීම
- කර්මාන්ත, ඉන්ධන සඳහා දැව භාවිතය
- හේන් ගොවිතැන සඳහා වනාන්තර එළිකිරීම.
- සංවර්ධන කටයුතු සඳහා යෙදවීම.

(b) • ජාතික රක්ෂිත හා අභය භූමි පවත්වාගෙන යාම.
- වනවගා ව්‍යාපෘති ඇති කිරීම
- වන සංරක්ෂණ උපාය මාර්ග අනුගමනය කිරීම
- ජනතාව දැනුවත් කිරීම
- පරිසර සංවේදී කලාප ඇති කිරීම.
- ප්‍රජා සහභාගිත්ව වන වගාව දිරිගැන්වීම.

9. i. 1. දේශගුණය, භූ විශමතාව, ජල පහසුව, සම්පත්වල ව්‍යාප්තිය

ii. 1 නැගෙනහිර ආසියාව 2. වයඹදිග යුරෝපය
3. දකුණු හා අග්නිදිග ආසියාව
4. ඇමරිකාවේ ඊශාන දිග වෙරළබඩ කලාපය

iii. (a) • මන්දගාමී අවධිය (ක්‍රි.ව. 1750 දක්වා)
- ක්‍රි.ව. 1750 සිට කෙටි කාලයක් තුල සිදුවූ සීඝ්‍ර වර්ධන අවධිය (ජන සංඛ්‍යා ස්ඵෝටන අවධිය)

(b) • ජන සංඛ්‍යාව වියපත් වීම
- බාල වයස්කාර ජන සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වීම
- වැඩිමහල් යැපෙන්නන් ප්‍රමාණය වැඩි වීම
- ජන සංඛ්‍යාවේ ස්ත්‍රී ප්‍රතිශතය වැඩි වීම